# ආචාරි ජාතකය

තවද දහම්ලයැති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් එක් නැවියෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේ අද දවස් මා දුටුව මැනවැයි යන සිතින් අවුදින් අචිරවති ගංතෙරට පැමිණ තොටියාට කියන සේක් එම්බල මම සර්වඥයන් වහන්සේ දක්නා අභිප්‍රාය ඇතිව යෙමි. වහා එතර කරවයි කී කල්හි ඒ තොටියා කියන්නේ නුඹ වහන්සේ මේ වෙලේ වඩින්නේ කිම්ද උදසන වැඩිය මැනවැයි කී කල්හි මෙතන මා සැතපෙන තැනක් නැත, වහා මා එතරකරවයි කී කල්හි තොටියා කිපී උන් වහන්සේ නැවට නන්වා ගෙණ තොටට නොවැද උන් වහන්සේගේ සිව්රුත් තෙමා කල්යවා තොටින් එතර කළේය. උන්වහන්සේ වහාරයට ගොස් රෑවු හෙයින් සර්වඥයන් වහන්සේ නොදැක දෙවැනි දවස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව සිටිසේක. සර්වඥයන් වහන්සේ වදාරණසේක් ඇයි භික්ෂුවෙනි කවද අවුදයි විචාළ කල්හි ස්වාමිනි ඊයේ ආමි යී කීසේක. එබස් අසා සර්වඥයන් වහන්සේ වදාරණසේක් ඊයේ අප නුදුටුයේ ඇයිදැයි විචාළකල්හි භික්ෂූහු කියනසේක් ගංතොට පදිනා තොටියා ගඟ පාතට ඔරුව පැද සිවුරු තෙමා මෙතර කළ හෙයින් සිවුරු වියලාගන්නා පිණිස ඊයේ දකින්ට නුවූයේය යි සැලකළ කල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක් එම්බා, මහණ තොටියා තොපට මතු නොවෙයි ගහට කළේ. පෙර උත්තමයන්ටත් ගහටකළේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ හිමාලය වනයෙහි තපස්ව වාසය කරන්නාහු ලුණු ඇඹුල් සපයා බරණැස් නුවරට අවුත් උයනේ වාසයකරන්නාහ. රජ්ජුරුවෝත් තාපසයන් ලඟට උයනට අවුත් දකිනාහ. ගියවිට දවස්පතා අවවාද කියන විට භූමිපාලොත්තමවූ රජජුරුවන් වහන්ස කාටත් නොකිපුණ මැනව. කා කෙරෙත් කෝපයක් නොකළ මැනව, එසේවූ කෝප නොවන්නාවූ රජ්ජුරුවන්ගේ යසස සදිසාන්තයේ පූජ්‍යවන්නේය යි කීහ. තවද ග්‍රාමයෙහිද නැවත වනයෙහිද ජලයෙහිද භූමියෙහිද යන සියල්ලෙහිම මෛත්‍රියක් මිසක් කෝපයක් රථොත්තම වූ රජ්ජුරුවන් වහන්සේ කා කෙරෙත් නොකළ මැනවැයි මේ නියායෙන් දවස්පතා රජ්ජුරුවන්ට අවවාද කරන්නාහ. රජ්ජුරුවෝත් තාපසයන් කෙරේ පැහැද ලක්ෂයක් නිමන ගමක් දුන්නාහ. තාපසයෝ නොයිවසූහ. දොළොස් අවුරුද්දක් උපස්ථාන කළාහ. තාපසයෝත් එතන රඳන්ට කලකිරී රජ්ජුරුවන්ට කීවොත් යානොදෙති. උයන්ගොව්වාට කියා සැරිසරා ඇවිදිමියි උයනින් නික්ම පළාගියහ. යන්නෝ බරණැස් නුවර ගඟ සමීපයට ගියාහ. ඒ ගඟ මිනිසුන් ඇත් මෑත් කරන්නාවූ අපරිමාතු නම් නැවියා අඥාන එකෙක මිනිසුන් ගඟ එතරකළ කල එතරදී මිලදෙම්මැයි කියා එතරගොස් මිල නොදී පලායන්නාහ. මෙයින් මිල නොලදින් දුර්වලව ඉන්නේය. බෝධිසත්වයෝත් ගඟ අසල සිට මා එතර ලවයි කිහ. මට කුමන මිල දෙව්දැයි විචාළේය. තොපට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කෙරෙමියි කීහ. එවිට නැවියා ඒ වස්තුවෙක් දෝහෝයි සිතා තාපසයන් ගඟින් එතරලා මට වස්තු දෙවයි කීහ. තාපසයෝ කියන්නාහු වනයෙහිම සියල්ලෙහිම මෛත්‍රී කරවයි අවවාද කියා තොපි මිනිසුන් එතරලා ගන්නාහෙයින් වේද මිල නොදී යන්නේ එතරදීම මිල ඇරගෙණ විනා මිනිසුන් එතර නොකරවයි අවවාද කීහ. එවිට නැවියා තොප මට දෙන වස්තු මේ දැයි කියා තාපසයන් අල්වාගෙණ මූනට ඇන්නේය. රජ්ජුරුවන්ට අවවාද කියා ලක්‍ෂයක් නිමන ගමක් ලද්දාහ. අස්ථානයේ කටයුතු නො දක්නාවූ මූර්ඛයාට අවවාද කියා ඇනුන් ලද්දාහයි සර්වඥයන් වහන්සේ වදාළසේක. ඒ නැවියාගේ අඹු ඇවිදින් ඇයි තෝ කුමක් කෙරෙයිද රජ්ජුරුවන් වහන්සේට කුලූපග තාපසයන් වහන්සේට උන් වහන්සේ කුමට මරව් දැයි කීව්. එවිට තාපසයන් ඇර අඹු මැරීය. අඹුවගේ බඩ දරු ගර්භය වැටී අඹුව මළාය. එවිට එතන සිටියෝ මිනීමරු තැනැත්තේය යි නැවියා බැඳගෙන ගොස් රජ්ජුරුවන්ට පැවාහ. රජ්ජුරුවෝත් නැවියාට අඥානකර වුවයි සර්වඥයන් වහන්සේ වදාරා අඥානව තාපසයන් කී අවවාද නොගිවිස තමාගේ පුතුන් නොලැබ අඹුවත් නොලැබ ආඥා වීන්නේය යි වදාරා මේ ආචාරී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි නැවියා නම් මෙසමයෙහි නැවියා මය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය, තාපසව උපන්නෙම් බුදුවූ මම් ම යි වදාළසේක. මේ දේශනාවසානයේ භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක.